**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II - 2019**

----------------------------------------------------------------------------------------------------

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ - සංරචක II හි 2019 පෙබරවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 මැයි 16 දින එළඹි අංක. 8878 එල්කේ දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. (අ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම (ආ) නවෝත්පාදන ප්‍රදාන සහ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම (ඇ) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර දැක්වීම නමින් වූ කොටස් තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 697,936.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු.මිලියන 31,588 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. එයින් රු.මිලියන 2,245.12 ට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 14.22 ක් ව්‍යාපෘතියේ සංරචක - II යටතේ සිදුකිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහය සහ නවෝත්පාදන ප්‍රදාන සඳහා වෙන් කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

මූල්‍ය ප්‍රකශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | බලපෑම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ (Project Appraisal Document) 64 වන ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘති කාර්යාලය විසින් රේඛීය මට්ටමේ සහ පළාත් මට්ටමේ සෞඛ්‍ය අංශයේ වියදම් පිළිබිඹුවන පරිදි වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන දෙකක් සහ ව්‍යාපෘතියේ සංරචක -1 යටතේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් මූල්‍ය ප්‍රකාශන දෙකක් වෙන වෙනම පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම තවමත් සිදු කරමින් පවතී. | රේඛීය මට්ටමේ සහ පළාත් මට්ටමේ සෞඛ්‍ය අංශයේ වියදම් පිළිබිඹුවන පරිදි වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන දෙකක් සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදයකින් තොරව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු වුවද, මෙම කාල සීමාව තුළ කමිටුව අවස්ථා දෙකකදී පමණක් රැස්ව තිබුණි. තවද, කමිටුවට පත් කරන ලද සාමාජිකයින් 26 දෙනාගෙන්, රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගීවීමේ සාමාන්‍ය සියයට 54 ට වඩා අඩු විය. | කමිටුව පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීම. | රාජකාරිවල කාර්ය බහුල ස්වභාවය නිසා ලේකම්වරුන් දෙදෙනාගෙන් දිනයක් වෙන් කර ගැනීම ඉතා අපහසු විය. කමිටු සාමාජිකයින්ගේ පැමිණීම අපේක්ෂා කළ තරම් නොවූ අතර සහභාගීත්වය වැඩි කිරීම සඳහා පළාත් අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කිරීමට නියමිතය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය යුතු අතර කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය වැඩි කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 1989 නොවැම්බර් 30 දිනැති අංක. පීඑම්/පීඑස්/05 දරන අග්‍රාමාත්‍ය කාර්යාල චක්‍රලේඛය | විදේශ සංචාරවලින් පසු දිවයිනට පැමිණෙන නිලධාරීන් විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, තායිලන්තය, කොස්ටාරිකාව සහ චීන සංචාරවල නිරත වූ නිලධාරීන් 27 දෙනෙකු විසින් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කිරීම | අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී. | වාර්තාව ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) 2015 මැයි 15 දිනැති අංක. එම්එෆ්/6/1/1/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය. | දිනකට එක්සත් ජනපද ඩොලර් 40 ක අනියම් දීමනාවක් ගෙවිය හැකි වුවද, කොස්ටාරිකාව සහ චීනය යන රටවල පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් 11 දෙනෙකු සඳහා පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 3,850 ක් සහ එක්සත් ජනපද ඩොලර් 210 ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කිරීම. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 59 ඡේදය ප්‍රකාරව, එක්සත් ජනපද ඩොලර් මිලියන 5 ක් වෙන්කළ ධාරිතා වර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඵලදායී ධාරිතා වර්ධන වැඩසටහනක් සැකසීමට අපොහොසත් වීම සහ එය කාලෝචිතව ක්‍රියාත්මක නොකිරීම. | ව්‍යාපෘතිය සඳහා සුදුසු වැඩසටහනක් සකස් කිරීමට පියවර ගනිමින් සිටී. | ක්‍රියාත්මක කිරීමට පෙර වැඩසටහන අනුමත කළ යුතුය. |